# සාමාන්‍ය සමයේ පසළොස් වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 55: 10–11

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"අහසින් වසින වැස්ස පොළොව සරු සාර කර ධාන්‍ය ලබා දෙයි."

"අහසින් වැටෙන හිම හා වසින වැස්ස නැවත හැරී නොගොස් පොළොව සරු සාර කර, පැළ නංවා, කරල් හට ගන්වා වපුරන්නාට ධාන්‍ය ද මිනිසාට ආහාර ද ගෙන දෙයි. එලෙස මා මුවින් නික්මෙන වචන මා වෙත ම හිස් ව නොපැමිණ මාගේ අදහස් සඵල කර නියමයන් සිතුරට ම ඉටු කරයි."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 65: 9–13

පිළිතුර : සරු බිමේ වැටී පැළ වූ බීජ මහත් සේ එල දරන්නේ ය.

ගීය : ඔබ පොළොව දෙස බලා, එයට වැහි වස්වා,
එය සරුසාර කරන සේක.
අහස් ගඟ දිය දහරින් පිරී ඇත.
ඔබ පොළොව මෙසේ පිළියෙල කොට ධාන්‍ය සපයා දෙන සේක.
එහි හීවිටි බොහෝ සේ දියෙන් පොඟවා
පස් පිඩලි සමතලා කරන සේක.

ඒ පිට බහුල ව වැසි වස්වා, පොළොව බුරුල් කර
එහි වගාවට ආසිරි දෙන සේක.
ඔබ වැසි වස්වා රට සරු සාර කරවන සේක.
ඔබ සැරිසරන තැන සාරත්වය, උතුරා යන්නේ ය.

පාළුකරයේ තණ බිම සරුසාර වනු ඇත:
කඳු හෙල් ප්‍රීතියෙන් උදම් අනනු ඇත.
තණ බිම එළු බැටළු පට්ටිවලින් පිරී ඇත.
මිටියාවත් ධන ධාන්‍යයෙන් සපුරාලන සේක.
ඒවා ප්‍රීතියෙන් කුල්මත් වී ගී ගයයි.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 8: 18–23

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"මවා ඇති මේ සක්වළ වුවද දේව පුත්‍රයාණන්ගේ පහළවීම
අධික ආශාවෙන් පුල පුලා බලා සිටියි."

මේ ජීවිතයේ දුක් වේදනා, අපට මතු එළිදරව් වන්නට යන මහිමය සමඟ කිසි සේත් සැසඳිය නොහැකි ය යි කල්පනා කරමි. මවා ඇති මේ විශ්වය වුව ද දේව පුත්‍රයන්ගේ එළිදරව් වීම පුල පුලා බලා සිටියි. මන්ද, විශ්වය ශුන්‍යතාවට යටත් කළ තැනැත් වහන්සේ එසේ කළේ, විශ්වයේ කැමැත්තෙන් නොව, එසේ යටත් කළ උන් වහන්සේගේ ම බලාපොරොත්තු සහගත කැමැත්තෙනි. ඒ බලාපොරොත්තුව නම් මවා ඇති මේ විශ්වය ජරාපත් වීමේ වහල් කමෙන් මිදී දේව දරුවන්ට හිමි මහිමාන්විත නිදහස ලැබීම ය. මවා ඇති මුළු විශ්වය මේ දක්වා ම ප්‍රසව වේදනාවෙන් කෙඳිරිගානා බව අපි දනිමු. එපමණක් නොව, ආත්මයාණන් වහන්සේ කෙරෙන් වන දීමනාවේ තාඹූල් එල ලැබූ අපි ද, අපේ කායික මිදීම වන, පුත්‍රකමට පිළිගනු ලැබීමේ බලාපොරොත්තුවෙන් අප තුළ ම සුසුම් ලමු.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
"අවංක පිරිසිදු සිතකින් දේව වචනය අසා පිළිපැද
නොපසුබට වීර්යයෙන් ඵල දරන්නෝ භාග්‍යවන්තයෝ"යි
ස්වාමීන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 13: 1–23 හෝ 1–9

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### "වපුරන්නෙක් වපුරන්නට ගියේ ය."

එදින ම ජේසුස් වහන්සේ ගෙදරින් නික්ම ගොස් මුහුද අද්දර වැඩහුන් සේක. අති විශාල සමූහයක් උන් වහන්සේ වෙත රැස් වූ බැවින් උන් වහන්සේ ඔරුවකට නැගී හිඳ ගත් සේක. මුළු ජනකාය වෙරළෙහි සිටියහ. උන් වහන්සේ ඔවුන්ට බොහෝ දේ උපමා වලින් පහදා දෙමින් මෙසේ වදාළ සේක. "බලන්න, වපුරන්නෙක් වපුරන්නට ගියේ ය. ඔහු වපුරන කල මෙසේ සිදුවිය: බීජ සමහරක් මඟ දිගේ වැටිණි. කුරුල්ලෝ අවුත් ඒවා අහුලාගෙන කෑහ. සමහරක් පස තුනී ගල් බිම්වල වැටී, පස ගැඹුරු නුවූ බැවින් වහා ම පැළ විය. එහෙත් හිරු නැගුණු කල ඒවා දැවී මුල් නැති බැවින් වියළී ගියේ ය. අන් සමහරක් කටු ගස් අතර වැටිණි. කටු ගස් වැවී ඒවා යට කර දැමී ය. තවත් සමහරක් සරු බිමෙහි වැටී එකකින් සිය ගුණයක් ද එකකින් සැට ගුණයක් ද එකකින් තිස් ගුණයක් ද බැගින් ඵල දැරී ය. සවන් ඇත්තෝ සවන් දෙත්වා!"

(එවිට ශ්‍රාවකයෝ ඇවිත් "ඔබ වහන්සේ ඔවුන්ට උපමාවලින් කතා කරන්නේ මන්දැ" යි ඇසූහ. උන් වහන්සේ මෙසේ උත්තර දුන් සේක. "ස්වර්ග රාජ්‍යය පිළිබඳ අභිරහස ඔබට දන්වා දී ඇත. එහෙත් ඔවුන්ට එසේ දී නැත. යමෙකුට ඇත්තේ ද, ඔහුට දෙනු ලැබේ. පමණටත් වඩා ඔහුට ලැබේ. යමෙකුට නැත්තේ ද, ඔහුට ඇති දෙයත් ඔහුගෙන් ගනු ලැබේ. එහෙයින් ඔවුන් දැක දැකත් නොදක්නා නිසා ද, අස අසාත් නොඅසන නිසා ද, වටහා නොගන්න නිසා ද ඔවුන්ට උපමා මඟින් කතා කරමි. මෙසේ යෙසායාගේ දිවැස් කීම ඔවුන් කෙරේ ඉෂ්ට වනු ඇත.

එනම්: ‘ඔබ අස අසාත් තේරුම් නොගන්නහු ය. දැක දැකත් නොදක්නහු ය. මේ සෙනගගේ සිත් අඳුරු ය. ඔවුන්ගේ කන් වැසී ඇත. ඔවුන්ගේ ඇස් පියවී ඇත. එසේ නොවී නම්, ඔවුන් ඇසින් බලා, කනින් අසා, සිතින් තේරුම් ගෙන හැරෙනු ඇත. මම ද ඔවුන් සුවපත් කරමි.’ යනු යි.

එහෙත් ඔබට ඇසින් පෙනෙන නිසා ද කනින් ඇසෙන නිසා ද ඔබ භාග්‍යවන්තය. සැබැවින් ම මම ඔබට කියමි. බොහෝ දිවැසිවරයන් ද දැහැමි අය ද ඔබ දකින දේ දකින්නටත්, අසන දේ අසන්නටත් ආසා වූ නමුත්, ඔවුන් ඒවා දුටුවේ වත් ඇසුවේ වත් නැත. එබැවින් වපුරන්නා පිළිබඳ උපමාව තේරුම්ගන්න. යමෙක් රාජ්‍යය පිළිබඳ පණිවුඩය අසා එය වටහා නොගනී නම්, ඔහුගේ සිතේ වැපුරූ දේ නපුරා අවුත් පැහැරගනියි. මග දිගේ වැටුණු බීජ යන්නෙන් අදහස් කරනුයේ එවැනි අය ය. පණිවුඩය ඇසූ කෙණෙහි ම එය සතුටින් පිළි ගනිතත්, සිත්හි තැන්පත් වී නැති බැවින්, මඳ කලක් පැවත, පණිවුඩය නිසා හිංසාවක් හෝ පීඩාවක් හෝ පැමිණි වහා ම කෙනෙක් පැකිළී වැටෙති. ගල් බිම්වල වැටුණු බීජ යන්නෙන් අදහස් කරනුයේ එවැනි අය ය. පණිවුඩය අසා, මේ ජීවිතයේ කරදරවලින් ද වස්තු මායාවෙන් ද පණිවුඩය යටපත් වීම නිසා, කෙනෙක් එල නොදරති. කටු අතර වැටුණු බීජ යන්නෙන් අදහස් කරනුයේ එවැනි අය ය. පණිවුඩය අසා එය වටහා ගෙන සිය ගුණයක් ද සැට ගුණයක් ද තිස් ගුණයක් ද බැගින් කෙනෙක් එල දරති. සරු බිමෙහි වැපුරූ බීජ යන්නෙන් අදහස් කරනුයේ එවැනි අය ය.”)

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

*(වරහන් අතර කොටස අත් හළ හැකි ය.)*